**රුහුණ විශ්වවිද්‍යාලය**

**2018/2019 අධ්‍යයන වර්ෂය**

**ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 2000 ස්ථලය**

**පළමු සමාසික පරීක්ෂණය - 2019 ඔක්තෝබර්**

**ACL 21623 - පුරාවිද්‍යාවේ ඉතිහාසය- ගෝලීය දැක්ම**

ප්‍රශ්න <u>හතරකට</u> <u>(04)</u> පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකරුවලට ලකුණු අඩු විය හැකි ය.)

**කාලය : පැය 03 යි**

---

1. චාල්ස් ඩාර්වින්ගේ පරිණාමවාදී සංකල්පවල සංවර්ධනයට චාල්ස් ලයෙල් ගේ භූගර්භවිද්‍යා මූලධර්ම හා තෝමස් මල්තුස්ගේ ජනගහන වර්ධනය පිළිබඳ මූලධර්ම බලපෑ අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 15)

2. චාල්ස් ඩාර්වින්ගේ පරිනාමවාදී සංකල්ප පසුකාලීන මානව විද්‍යාඥයින්ගේ (Anthropologists) හා මානවවංශ විද්‍යාඥයින්ගේ (Ethnographers) අධ්‍යයනවලට කළ බලපෑම විමසීමට ලක්කරන්න. (ලකුණු 15)

3. පුරාවිද්‍යාව තුළ ද්‍රව්‍යාත්මක සංස්කෘතිය (Material Culture) වර්ගීකරණය හා ඒ මඟින් සංස්කෘතික පරිණාමය අධ්‍යයනය කිරීමේ ප්‍රාරම්භක ප්‍රයත්නයක් ලෙස යුගත්‍රය න්‍යාය (Three Age System) සාකච්ඡාවට භාජනය කරන්න. (ලකුණු 15)

4. 19 වැනි ශතවර්ෂයේ පුරාවිද්‍යාවේ වූ වර්ධනයන් ලොව පැරණි ශිෂ්ටාචාර සොයා ගැනීම හා පුරාවිද්‍යා විධික්‍රමවල වූ දියුණුව ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

5. 19 වැනි ශතවර්ෂයේ මැද භාගයේ මිනිසාගේ පෞරාණිකත්වය තහවුරු කිරීමට දායක වූ පුරාවිද්‍යාත්මක සොයා ගැනීම ෂැක් බූෂේ ද පර්තස් (Jacques Boucher de Perthes), ජෝන් ඉවාන්ස් (John Evans), ජෝෂප් ප්‍රෙස්ට්විච් (Joseph Prestwich) හා ජෝන් ලබක් (John Lubbock) යන අයගේ අධ්‍යයන ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

6. අතීත පරිසරය (Paleoecology) හා අතීත ආර්ථික රටාව (Paleoeconomy) අධ්‍යයනය කිරීමේ පුරාවිද්‍යා ප්‍රවේශය ජුලියන් ස්ටුවර්ඩ් (Julian Steward) හා ජේ.ජී.ඩී. ක්ලාර්ක් (J.G.D. Clark) වැනි අයගේ අධ්‍යයන ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

7. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න.

i. නව පුරාවිද්‍යාව
ii. ගෝර්ඩන් චයිල්ඩ් ගේ පුරාවිද්‍යා අධ්‍යයන
iii. අතීතය පිළිබඳ මිථ්‍යා විශ්වාස පැවති යුගය (Speculative phase)
iv. තෝමස් ජෙෆර්සන් (Thomas Jefferson) ගේ පුරාවිද්‍යා කැණීම්

(ලකුණු 7.5×2 = 15)

@@@@@@@@@@@